" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ISO 9001 | SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/30-38/FI/01 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2024.07.08

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2024.06.28 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(IV)හා 2024.06.07 | ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම |
| 02. | පොදු චක්‍රලේඛ ලිපි අංක: 02-76/2024 හා 2024.05.08 | සෞඛ්‍ය අංශයේ කාර්යය මණ්ඩලය සඳහා විශේෂ රාජකාරි දීමනාව ගෙවීම |

02. මෙම චක්‍රලේඛ පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

නදීෂා සී. සපරමාදු,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන).
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092608
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 14/2022(IV)

මගේ අංකය : EST-6/03/LEA/3162(4)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2024.06.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම

රාජ්‍ය නිලධරයන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීමට අදාළව නිකුත් කරන ලද 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I), 2022.09.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(II) හා 2023.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(III) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛ විධිවිධාන යටතේ වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා/ දැනටමත් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති නිලධරයන් සම්බන්ධයෙන් පහත සඳහන් විශේෂිත විධිවිධාන යටතේ කටයුතු කිරීමට 2024.05.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

2.1 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I), 2022.09.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(II) හා 2023.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(III) විධිවිධාන යටතේ රාජ්‍ය නිලධරයන්ට වැටුප් රහිත දේශීය/ විදේශ නිවාඩු ලබා දීමේ දී නිවාඩු ලබා දෙන අවම කාල සීමාව වසරක් විය යුතු ය.

2.2 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I) මගින් සංශෝධිත 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022හි "ඔ" වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම.

"මෙම චක්‍රලේඛය යටතේ නිවාඩු ලබා ගන්නා නිලධරයා සමඟ ගිවිසුමට එළඹීම අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට ලේකම්වරයා විසින් බලය පවරන ලද අතිරේක ලේකම්වරයෙකුට/ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට ද සිදු කළ හැකි ය."

2.3 ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය යටතේ වන ඉකුත් නිවාඩු ලබා දීමේ විධිවිධානයන්ට අමතරව 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා එහි ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව විදේශ නිවාඩු ලබා ගැනීමේ දී රාජ්‍ය නිලධරයන්ට එම විදේශගත වීම සඳහා අවශ්‍ය වන පුහුණු පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා ද ඉකුත් නිවාඩු ලබා ගත හැකි ය. පුහුණු පාඨමාලාව අවසානයේ දී එය සම්පූර්ණ කළ බව සනාථ කරමින් ලබා දෙන සහතික පත්‍රය ඉකුත් නිවාඩු අනුමතිය ලබා දීම සඳහා ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. යම් නිලධරයෙකු අදාළ සහතික පත්‍රය

ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් නිවාඩු ලබා ගන්නා ලද කාලය වැටුප් රහිත නිවාඩු ලෙස සැලකිය යුතු ය.

2.4 2022.09.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(II) යටතේ දේශීය වැටුප් රහිත නිවාඩු ලබන නිලධරයන් හට එම නිවාඩු කාල සීමාව තුළ දී තමාගේ නමින් ව්‍යාපාර ආරම්භ කිරීමටත්, එම ව්‍යාපාර ලියාපදිංචි කර පවත්වාගෙන යාමටත් හැකියාව පවතින අතර නිවාඩු කාල සීමාව අවසන් කර, නැවත සේවයට වාර්තා කිරීමෙන් පසු අදාළ රජයේ නිලධරයා නැවතත් ආයතන සංග්‍රහයේ XXX වැනි පරිච්ඡේදයේ විධිවිධානයන්ට යටත්ව කටයුතු කළ යුතු වේ.

2.5 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන යටතේ නිවාඩු ලබන නිලධරයන් හට නිවාඩු කාල සීමාව තුළ දී වුව ද,

2.5.1 කාර්යක්ෂමතා කඩඉම් විභාග හා රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම සඳහා අවස්ථාව ලබා දිය යුතු ය.

2.5.2 නිවාඩු ලබාගැනීමට ප්‍රථම අදාළ සියලු සුදුසුකම් සපුරා ඇත්නම්, දීප ව්‍යාප්ත සේවාවල හෝ රජයේ සේවයේ වෙනත් තනතුරු සඳහා වන තරඟ විභාග සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට එලෙස නිවාඩු ලබා තිබීම බාධාවක් නොවේ.

යම් නිලධරයෙකු දීප ව්‍යාප්ත සේවයේ හෝ රජයේ සේවයේ වෙනත් තනතුරක් සඳහා පත්කිරීමේ හෝ උසස් කිරීමේ තරඟ විභාගයකට/ සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දී ඉන් සමත්ව ඇත්නම් සහ එම තනතුරු සඳහා තේරී පත් වූයේ මෙම නිවාඩු ලබා ගන්නා කාල සීමාව තුළ නම්, එම නව තනතුර භාර ගැනීමේ අවස්ථාව ඇති අතර, මෙතෙක් ලබා ඇති නිවාඩුව සේවයට වාර්තා කර අවසන් කිරීමෙන් අනතුරුව පූර්ව සේවයෙන් විධිමත් පරිදි නිදහස්ව නියමිත කාලය තුළ නව තනතුර භාර ගැනීමට කටයුතු කළ යුතු ය. තවදුරටත් ඉතිරි නිවාඩු කාල සීමාව ලබාගැනීම, නව තනතුරට අදාළව මෙම චක්‍රලේඛවල පවතින විධිවිධාන අනුව සිදු කළ යුතු ය.

2.5.3 මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ විදේශ නිවාඩු ලබා ඇති විට දී, රාජ්‍ය සේවයේ පත්වීමක්/ උසස්වීමක් සඳහා සුදුසුකම් ලබන යම් තරඟ විභාගයකට මුහුණ දීමට හෝ සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීමට ශ්‍රී ලංකාවට පැමිණ නැවත විදේශගත වීමට නිවාඩු ලබා තිබීම බාධාවක් නොවේ.

2.6 නිවාඩු ලබන නිලධරයාගේ තනතුර ආයතනය තුල පුරප්පාඩුවක් ලෙස සළකා පූර්ණකාලීනව වෙනත් නිලධරයකු පත් කිරීමට/ ස්ථාන මාරු කිරීමට පත්කිරීම් බලධරයාට අවස්ථාව ඇත. නමුත් නිවාඩු ලබන නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුව අදාළ නිලධරයා නිවාඩු ලබන අවස්ථාවේ දී සේවය කළ ස්ථානයේ ම නඩත්තු කළ යුතු වේ. එසේ දැනට විදේශ ගත වී ඇති නිලධරයන්ගේ මෙන්ම ඉදිරියට විදේශ ගතවන නිලධරයන්ගේ ද වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයවීම හා විදේශ මුදල් ප්‍රේෂණය කිරීමට අදාළ තොරතුරු යාවත්කාලීන කර තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

තව ද, අත්‍යවශ්‍ය අවස්ථාවක දී පත්කිරීම් බලධරයාගේ ද එකඟත්වය ඇතිව මිස මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ නිවාඩු ලබන නිලධරයන්ගේ වැඩ බැලීමට/ රාජකාරි ඉටු කිරීමට නිලධරයන් පත් නොකළ යුතු ය.

2.7 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ යටතේ ලබා ගන්නා ලද වැටුප් රහිත නිවාඩු කාලය 2023.07.10 දින තෙක් අනුමතිය ලබා ගත් නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට ද 2023.07.11 දින සිට නිවාඩු අනුමතිය ලබා ගත් නිලධරයන්ගේ විශ්‍රාම වැටුපට ද පමණක් අදාළ කර ගත යුතු අතර වෙනත් කිසිදු අවස්ථාවක් සඳහා සක්‍රීය සේවා කාලයක් ලෙස අදාළ කර නොගත යුතු ය.

ඒ අනුව, මෙම වැටුප් රහිත නිවාඩු කාලය, විශ්‍රාම යන අවස්ථාවේ දී 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හා එහි ආනුෂංගික චක්‍රලේඛ යටතේ ලබා දෙනු ලබන සහනදායී වාහන ආනයන බලපත්‍රය ලබා දීමේ දී සක්‍රීය සේවා කාලයක් ලෙස අදාළ කර ගත නොහැක.

2.8 රාජ්‍ය සේවයේ පවතින එක් එක් සේවාවට හා තනතුරුවලට අදාළ පරිපාලන බලධරයන් විසින් ඒ ඒ සේවාවන්හි/ තනතුරුවල අතිරික්ත සේවක සංඛ්‍යාවන් පවතී ද යන්න හඳුනාගත යුතු අතර, එම නිලධරයන් ගේ නාම ලේඛනයක් පවත්වාගෙන යාම පරිපාලන බලධරයා විසින් සිදු කළ යුතු ය.

ඒ අනුව, 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා නිලධරයන් වෙනුවෙන් ඇති වන ආයතනික පුරප්පාඩු සඳහා එම නාම ලේඛනයෙන් අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාවලියක් යටතේ නිලධරයන් අනුයුක්ත කිරීමට කටයුතු කිරීම පරිපාලන බලධරයා විසින් සිදු කළ යුතු ය.

2.9 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන යටතේ රාජ්‍ය නිලධරයන්ට වැටුප් රහිත දේශීය/ විදේශීය නිවාඩු ලබා දීමේ දී අදාළ අයදුම්පත්‍ර නිවාඩුව ආරම්භ කරන දිනට අවම මාස 03කට පෙර කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

2.10 මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා නිලධරයන්ගේ වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා කාල සීමාව තුළ දී අග්‍රහාර රක්ෂණ දායක මුදල් අයකර ගැනීම සිදු නොකළ යුතු අතර එම කාල සීමාව තුළ අග්‍රහාර ප්‍රතිලාභ ලබා ගැනීමට හිමිකමක් නොමැත.

2.11 වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා නිලධරයන්ට එම නිවාඩු කාලය තුළ දුම්රිය බලපත්‍ර හිමිකම නොලැබේ.

2.12 මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ වැටුප් රහිත දේශීය නිවාඩු ලබා සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ සේවයේ නිරත වීමට බාධාවක් නොමැත.

2.13 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I)හි අනු අංක 10 'ච' වගන්තිය යටතේ දක්වා ඇති පරිදි එවිය යුතු ඩොලර් ප්‍රමාණයට සරිලන ජාත්‍යන්තර මුදල් ඒකකයක මුදල් ප්‍රමාණයක් (මුදල් ප්‍රේෂණය කරන දිනට අදාළව) ප්‍රේෂණය කළ හැකි ය.

2.14 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I)හි අනු අංක 10 'ච' වගන්තිය යටතේ දක්වා ඇති මුදල් ප්‍රේෂණය කිරීම සඳහා විදේශගත වූ දින සිට මාස දෙකක සහන කාලයක් ලබා දී ඇති අතර, තුන්වන මාසයේ සිට හිඟ මුදල් ද සමඟ මුදල් ප්‍රේෂණය කළ යුතු ය.

2.15 වැටුප් රහිත විදේශීය නිවාඩු අනුමත කරගෙන විදේශගතව නැවත මෙරටට පැමිණි අවස්ථාවක දී, 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I) චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විදේශ ගත වූ කාලයට අදාළ මුදල් මෙරටට ප්‍රේෂණය කර නොමැති නම් ඔවුන් ලබා ගත් එම නිවාඩු කාලය ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට අදාළ කර නොගන්නා වැටුප් රහිත නිවාඩු කාලයක් ලෙස හා 2023.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(III) විධිවිධාන ප්‍රකාරව ඔවුන් ලබා ගත් එම නිවාඩු කාලය විශ්‍රාම වැටුපට අදාළ කර නොගන්නා වැටුප් රහිත නිවාඩු කාලයක් ලෙස සැලකිය යුතු ය.

2.16 2022.09.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(II) යටතේ වැටුප් රහිත දේශීය නිවාඩු ලබා පෞද්ගලික අංශයේ රැකියාවක නිරත වන නිලධරයෙකුට සේවක අර්ථසාධක අරමුදල් හිමිකම ලබා ගත හැකි ය.

2.17 2023.07.10 දිනට පෙර දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සඳහා විධිමත් පරිදි නිවාඩු අනුමත කරගෙන තිබූ නිලධරයන් විසින් එකී නිවාඩු කාල සීමාව තවදුරටත් දීර්ඝ කිරීමට ඉල්ලුම් කරනු ලබන අවස්ථාවල දී එම නිවාඩු සංශෝධනය කළ යුතු වන්නේ 2023.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(III)හි විධිවිධාන අනුව ය.

2.18 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ යටතේ ලබාගන්නා වැටුප් රහිත දේශීය/ විදේශීය නිවාඩු වැටුප් වර්ධක පිළිබඳ කාර්යය සඳහා ගණන් ගත යුතු වේ.

නිලධරයා එසේ වැටුප් රහිත නිවාඩු ලබා නොගත්තේ නම්, එළඹීමට හැකිව තිබුණාවූ වැටුප් පියවරෙහි තැබිය හැකි අතර එසේ කළ යුත්තේ සාමාන්‍යයෙන් වැටුප් වර්ධක ගෙවීම සඳහා නුසුදුසු බවට පත් කෙරෙන වැටුප් රහිත නිවාඩු කාලය තුළ වූ වැඩ හා හැසිරීම සම්බන්ධයෙන් අහිතකර වාර්තාවක් නිලධරයාගේ වැටුප් වර්ධක ලබාදෙන බලධරයාට ඉදිරිපත්ව නොතිබුණ විට පමණි.

03. මෙම චක්‍රලේඛ විධිවිධාන 2024.05.13 දින සිට ක්‍රියාත්මක වේ.


ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk